3 ශ්‍රේණිය සිංහල
ගුරු අත් පොතට
වැඩ පොත - අංක 07

L4, S4, R4, W4
නිපුණතා ආවරණය - 2021

- එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා සවන් දෙයි.
- එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා කතා කරයි.
- එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා කියවයි.
- එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා ලියයි.

සැකසුම - හසිත හෙට්ටිආරච්චි

(Dip. In Sci. N.I.E./O.U.S.L.)

For Online Class details WhatsApp 071-9020298

3 ශ්‍රේණිය මව්බස (සිංහල)
$L_4 S_4 R_4 W_4$ ඉගෙනුම් පල

- උපදෙස් එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා සවන් දෙයි.
- එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා කතා කරයි.
- එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා කියවයි.
- එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා ලියයි.

පුස්තකාලය.

- පුස්තකාලයේ දී හැසිරිය යුතු ආකාරය.
  1. නිශ්ශබ්ද ව එකිනෙකා පසුපස පුස්තකාලයට යා යුතු ය.
  2. නිශ්ශබ්ද ව හැසිරිය යුතු ය.
  3. පොත් තබා ඇති පිළිවෙළ අවුල් නොකළ යුතු ය.
  4. නිශ්ශබ්ද ව පොත කියවිය යුතු ය.
  5. කියවූ පොත අදාළ ස්ථානයේ තැබිය යුතු ය.
  6. පුස්තකාලය භාර ගුරුවරියගේ උපදෙස් පිළිපැදිය යුතු ය.
  7. විවිධ වර්ගවලට අනුව නම් කර ඇති පොත් තබා ඇති ස්ථාන හඳුනා ගැනීම.
  8. පොතක් රැගෙන වාඩි වී නිශ්ශබ්ද ව පොත කියවීම.
  9. පොත කියවා නිම වූ පසු මේසය මත තැබීම.
  10. නිශ්ශබ්ද ව පුස්තකාලයෙන් පිටවීම.
  11. . . . . .

ප්‍රවෘත්ති.

ප්‍රවෘත්ති ප්‍රකාශය

ආයුබෝවන්

මේ කලණ ළමා රූපවාහිනී සේවය යි.

ප්‍රවෘත්ති ප්‍රකාශය

ඉදිරිපත් කිරීම . . . . . .

මුලින් ම සිරස්තල

- ජාතික මදුරු මර්දන සතියේ දී පාසල් පිරිසිදු කිරීමට පියවර ගනියි.
- ජල සම්පත රැක ගැනීමට මධ්‍යම පරිසර අධිකාරිය මහජනතාවගේ සහාය පතයි.
- ජාතික මදුරු මර්දන සතිය මාර්තු මස 29 දින සිට අප්‍රේල් මස 4 වැනිදා දක්වා පැවැත්වෙයි. මදුරු උවදුර රටපුරා වසංගතයක් වී ඇත. එබැවින් පාසල් සහ ඒ අවට පිරිසිදු කිරීම කඩිනමින් කළ යුතු කාර්යයකි. ඒ සඳහා සිසුන් සහ දෙමවුපියන්ගේ සහාය ලබාගත යුතු බව අධ්‍යාපන අමාත්‍යාංශය දැනුම් දෙයි.

- මිනිසාගේ එදිනෙදා කටයුතුවලට අවශ්‍ය වන්නේ ජලය යි. මේ වන විට අප රටේ ජල සම්පත විනාශ වෙමින් පවතී. මෙම අයහපත් ප්‍රතිඵල විඳීමට සිදුවන්නේ අනාගත පරපුරට යි. ජල සම්පත විනාශ වීමට හේතු වන්නේ මිනිසාගේ අයහපත් ක්‍රියා ය. ගස් කැපීම, කළුගල් කැඩීම, වැලි ගොඩ දැමීම ඒ අතර ප්‍රධාන වෙයි. මෙවැනි අයහපත් ක්‍රියාමාර්ග වළක්වමින් ජල සම්පත රැක ගැනීමට දායක වන ලෙස මධ්‍යම පරිසර අධිකාරිය මහජනතාවගේ සහාය පතයි.

ප්‍රවෘත්ති සමාප්ත යි.

1. ප්‍රවෘත්ති ප්‍රකාශයේ සඳහන් ප්‍රවෘත්ති සිරස්තල දෙක ලියන්න.

. . . . . .

. . . . . .

. . . . . .

2. ප්‍රවෘත්ති ප්‍රකාශයෙන් කියවුණු තොරතුරක් ලියන්න.

. . . . . .

. . . . . .

3. අප රටේ ජල සම්පත විනාශවී මට හේතු වන මිනිසාගේ අයහපත් ක්‍රියා මොනවා ද ?

. . . . . .

. . . . . .

. . . . . .

4. ජාතික මදුරු මර්දන සතිය පැවැත්වෙන්නේ කුමන කාලය තුළ ද ?

. . . . . .

5. නිවසේ දී ප්‍රවෘත්ති ප්‍රකාශයකට සවන් දෙන්න. ඇසූ ප්‍රවෘත්තිය ලියන්න.

. . . . . .

. . . . . .

. . . . . .

. . . . . .

. . . . . .

. . . . . .

. . . . . .

. . . . . .

. . . . . .

. . . . . .

. . . . . .

නිවේදන

අප පාසලේ අලුතින් ඉදි කරන ලද පුස්තකාල ගොඩනැඟිල්ල විවෘත කිරීමේ උත්සවය ජූනි මස 30 වන බ්‍රහස්පතින්දා පෙරවරු 8.30ට පැවැත්වේ. ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා සහභාගි වෙයි. එදින සියලු සිසුන් ප්‍රධාන ආරාධිත අමුත්තා පිළිගැනීම සඳහා ගේට්ටුව අසල සිට ප්‍රධාන ශාලාව තෙක් දෙපස පෙළගැසී සිටිය යුතු ය. දෙමවුපියන් අනිවාර්යයෙන් උත්සවයට සහභාගි විය යුතු ය. ඔවුන් පෙරවරු 8.30ට පෙර ප්‍රධාන ශාලාවේ අසුන් ගත යුතු බව සංවිධායක මණ්ඩලය දැනුම් දෙයි.

1. පුස්තකාලය විවෘත කිරීමේ උත්සවය පැවැත්වෙන්නේ කවරදා ද ?

. . . . . .

2. උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා කවුද ?

. . . . . .

3. උත්සව දිනයේ සිසුන් කළ යුත්තේ කුමක් ?

. . . . . .

4. පහත සඳහන් හිස් තැන්වලට සුදුසු වචන ලියන්න.

1. පුස්තකාලය විවෘත කිරීමේ උත්සවය පවත්වන්නේ . . . . . මස . . . . . වැනිදා ය.
2. ප්‍රධාන ආරාධිත අමුත්තා . . . . . ය.
3. සිසුන් . . . . . පිළිගැනීම සඳහා ගේට්ටුව අසල සිට ප්‍රධාන ශාලාව දක්වා දෙපස සිටිය යුතු ය.
4. දෙමවුපියන් . . . . . අසුන් ගත යුතු ය.

පුනරීක්ෂණ

තාරාවී... තාරාවී... ලස්සන සුදු තාරාවී
විලට බැසල පීනන්නේ...
ලස්සන සුදු තාරාවී...
පුංචි පැටවු රෑන සමග පීනයි ඈ සැමවිට...
ඒ අසළින් කැරකි කැරකි...
පැටවු නටයි වන්නම...

අභ්‍යාස

(1) මෙම කොටසින් කවර සත්ත්වයෙකු ගැන කියවේද?

.....

(2) ගීත කොටසෙහි 'ඈ' යනුවෙන් හඳුන්වන්නේ කවුද?

.....

(3) ගීත කොටසෙහි සඳහන් පහත සඳහන් දෑ නම් කරන්න.

1. ක්‍රියා පදයක් - .....

2. ස්ථාන නාම පදයක් - .....

3. නාම විශේෂණ පදයක් - .....

4. බහු වචන නාම පදයක් - .....

5. 'ඈ' ශබ්දය සහිත වචනයක් - .....

6. 'ලොකු' යන පදයේ විරුද්ධාර්ථ පදය - .....

7. 'පියකරු' යන්නට සමානාර්ථ පදයක් - .....

8. 'තාරාවී' යන පදයෙහි පුරුෂ ලිංග පදය - .....

ප්‍රහේලිකා

හරහට

1. රට වට කොට පිහිටා ඇත.
4. ගිනි ඇවිළීමේ දී මෙය පිට වේ.
6. 'සුළඟ' යන්නට සමාන පදයකි.

පහළට

1. යමක ඉහළ යන්න හැඳින්වීමට යෙදේ.
2. ජලය රත්වීමේ දී මේවා පිටවේ.
3. ළිප ඇවිළීමට යොදා ගනී.
5. 'යති' යන්නෙහි ඒක වචන පදය වේ.



හරහට

1. අතීතයේ දී වී මැනගත් උපකරණයකි.
3. පෙදරේරු කර්මාන්තය ආශ්‍රිත උපකරණයකි.
5. පොල් කෙඳි අඹරා නිපදවයි.

පහළට

1. සහල් පොලා ගැනීමට යොදා ගනී.
2. '..... එන' යුගල පදයකි.
4 වී වගා කරන කන්නයකි